# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**3 ශ්‍රේණිය -බුද්ධ ධර්මය 2021 ජුනි මාසය - 2 වන සතිය -11 පාඩම**

සැකසුම: බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

K.V.A.K.K. කොලොම්බුගම (ගුරු උපදේශක ප්‍රාථමික)

පාඩම: 11 තිත්තිර ජාතකය

<u>මෙය හොඳින් කියවන්න</u>

- පුතේ දුවේ ඔබේ බුද්ධ ධර්මය පෙළ පොත ඔබ අතට ගන්න
- බෙලෙක් පිඟානක් හෝ ප්ලාස්ටික් පිඟානක් අතට ගන්න
- එළිමහනේ ආරක්ෂිත ගසක් යට වාඩි වෙන්න
- පවුලේ නිදහස් සාමාජිකයෙක් සිටීනම් උදා-(ආච්චි, සීයා) ළඟට කැඳවා ගන්න
- පොතේ පාඩම 11 පිටුව 40 පෙරළන්න
- මේක ජාතක කතාවක් පුතේ
- මේ රූපයේ ඉන්න අය බලන්න

ඇතා,කුරුල්ලා, වඳුරා

01.දැන් ඔයාල කැමති තාලයකට මේ පළවෙනි කවිය ගායනා කරන්න

පිඟානට තට්ටු කරමින් තුන් වරක් ගයන්න

එකමත් එක කාලෙක
හිමාල වනයෙහි මැද//

ළඟ සිටින අයත් එකතු කරගන්න

මේ කවියෙන් කියවෙන්නේ

......................ඔන්න පුතේ දුවේ බොහෝම ඉස්සර කාලෙක ඉන්දියාවේ ඒ කියන්නේ අපේ රට අසලම ඇති රටේ හිමාලය කියලා විශාල වනාන්තරයක් තිබුණා

ඒක මැද්දේ නුග ගසක් තිබුණා. එතන ඇතෙකුයි වටුවා කියන කුඩා කුරුල්ලෙකු යි හිටියා.....................

02. දැන් දෙවන තුන්වන හතරවන කවි තාලයට ගායනා කරන්න

වාචක පිළිතුරු ලබා දෙන්න

1. මෙම ජාතක කතාවේ නම කුමක්ද?
2. සත්තු කීදෙනෙක් සිටියා ද? නම් කරන්න
3. නුග පැළය බඩේ ගැවුණේ කාගේද?

පැවරුම

1. සුදු කඩදාසියක්- අඟුරු කැට- පාට පෙට්ටියක් සපයාගන්න
2. මෙහි ඔබ සිත් ගත් අවස්ථා දෙකක් චිත්‍රයට නගන්න
3. පාට කරන්න
4. එම චිත්‍ර දෙක ඉතා ආරක්ෂිතව අරන් තබන්න